

## රටකට නීතියක් අවශ්‍යයි

ඇඩිලේඩ් ආච්බිෂොප්වරයා වෙනත් පූජකවරයකු විසින් පිරිමි ළමුන් දෙදෙනකුට කරන ලද ලිංගික අපචාරයක් සැඟවීමේ වරදට වැරදිකරු වී ඇත. නඩු විභාගයකින් පසු ඔහුට ලැබී ඇති දඬුවම වසරක සිර දඬුවමකි. ඔහු අවම වශයෙන් මාස හයක් හෝ මේ දඬුවම විඳිය යුතුය. ඕස්ට්‍රේලියාවේ පමණක් නොව ලෝකයේම මෙවන් දඬුවමක් ලැබූ කතෝලික සභාවේ උසස්ම පූජකවරයා ඔහු ය.

මෙහෙම කෙලින් නීතියක් තියෙන මේ රටට ආදරේ නොකර කොහොමද අප්පා... මේ රටේ චූටි මල්ලි දකින වැදගත්ම ලක්ෂණයක් වන්නේ නීතිය සැමට සමසේ ක්‍රියාත්මක වීමයි. "අපේ පල්ලියේ ලොක්කාට එරෙහිව නඩු දාලා.. ආගම විනාශ කරනවා" කියමින් පෙළපාලි යන උද්ඝෝෂන කරන පිස්සන් මෙහි නැතිවීම කොයිතරම් දෙයක්ද කියලා චූටි මල්ලිට හිතෙනවා.

බොහොම සරළයි. කෙනකු වරදක් කළා නම් ඔහු දඬුවම් ලැබිය යුතුය. ඒ බව මේ රටේ නීති ගරුක පුරවැසියෝ දන්නවා.

ආරක්ෂක ඇඳුම් පළඳින්නෙ නැතිව බෝට්ටුවක් පදවාගෙන ගිය අගමැතිට විරුද්ධව නඩු දාන්න. බීමතින් රිය පැදවූ ප්‍රිමියර්ගෙ පුතාට විරුද්ධව නඩු දාන්න බීමතින් රිය පැදවූ නඩුකාරයන්ට නඩු දාන්න පවා මේ රටේ නීතිය ශක්තිමත්. එහෙම තියෙද්දි සමහර රටවල නඩුකාරයන් නඩු අහන්නෙත් බීමතින්නෙ.

ඕනෑම රටක් ඉස්සරහට යන්න නම් නීතියේ ආධිපත්‍යය නිසි ලෙස ක්‍රියාත්මක විය යුතුයි. ලොකු කම් පොඩි කම් දේශපාලන හෝ ආගමික හෝ වෙනත් ආකාරයක හයිකාරකම් වලට නීතිය නැවෙනවා නම් ඒ රට ඉස්සරහට යන රටක් වෙන්නෙ නැහැ. ඒක පසුගාමී රටක්. චූටි මල්ලිට හිතෙන විදිහට නම් ඕනෑම රටක නීතිය ක්‍රියාත්මකවීමට බාධා කරන්නවුන්ට එරෙහි වන්නට ඒ රටේ පුරවැසියන්ට අයිතියක් තියෙනවා. තමන්ගෙ රට නීතියක් නැති රටක් බවට පත් කරගන්නට කැමති පිස්සන් ඉන්නෙ ලෝකයේ එකම රටක විතරයි. ඒ රට මොකක්ද කියලා අපි හැමෝම දන්නවා..



## කුසල් ජනිත් ගෙ ආත්ම ශක්තිය

බටහිර ඉන්දියා ක්‍රිකට් කණ්ඩායම එක්ක තිබ්බ දෙවන ටෙස්ට් තරගෙ දෙවෙනි ඉණිමෙදි කුසල් ජනිත් ආබාධයකට ලක්වුණේ පන්දු රකිද්දි දැන්වීම් පුවරුවක් උඩට වැටීම නිසා. නැගිටග න්නවත් බැරිව හිටිය ඔහුව වහාම ගිලන් රථයකින් රෝහලට ගෙනිච්චා. කවුරුත් හිතුවෙ ඔහුට ආයෙම සෑහෙන දවසකට නැගිටගන්න බැරිවේවි කියලා.

ඒත් තරගයේ අන්තිමේදි ලංකාවට ජයග්‍රහණය සඳහා අවශ්‍ය ලකුණු ප්‍රමාණය වෙනුවෙන් ගිය සටනෙදි අපේ ක්‍රීඩකයන් එකි නෙදා දැවී යද්දි කුසල් ජනිත් ආපහු පිටියට බහිනවා. ඇඟ වටේ දාපු ප්ලාස්ටර් පිටින්. චූටි මල්ලිගෙ ඇඟම හීතල වෙලා ගියා මේ ධෛර්යවන්ත ක්‍රීඩකයා දැකලා. ආවා විතරක් නෙවෙයි ලංකාවට අවශ්‍යම වෙලා තිබ්බ ජයග්‍රහණයත් ලබා දුන්නා.

අපි හැමෝම කතාවට කියනවා ක්‍රිකට් ක්‍රීඩකයො සෙල්ලම් කරන්නෙ සල්ලි වලටමයි කියල. ඒත් කුසල් ජනිත් අපට පෙ න්නලා දුන්නෙ ක්‍රීඩාවේ සල්ලි වලින් එහාට ගිය දෙයක් තියෙනවා කියන එකයි. ඔහු මේ වෙලාවෙදි පෙන්නුව ධෛර්යට ප්‍රසංසා කරන්න චූටි මල්ලි ළඟ වචන නැහැ. වෙල්ඩ න් කුසල් කියල බොක්කෙන්ම කියනවා.

## හැඳි නොගා හදන හොදි

"හැඳි නොගා හදන හොද්දයි පාලනයකින් තොරව හදන දරුවයි දෙන්නම එකයි" අපේ ආච්චි අම්මා නිතරම කිව්ව කියමනක් ඒක. චූටි මල්ලිට ඒ කතාව මතක් වුණේ ගිය සුමානෙ යාලුවෙකුගෙ ගෙදර පාටියකට ගිය වෙලාවෙ.

මේ පාටියට එක්තරා යුවලක් ඇවිත් හිටියා එයාලගෙ අවුරුදු තුන හතරක් වෙච්ච දුවෙ කුත් එක්ක.  ඒ ගෙදරට ආව වෙලාවෙ ඉඳන් ඒ දරුවා ඒ ගෙදරට කළ හානිය දැක්කම චූටි මල්ලිට පුදුම හිතුණා.

සාලයේ තිබ්බ ලස්සනම ලස්සන මල් පොකුර ඒ දරුවා කෑලි කෑලි වලට කඩලා දැම්මෙ දරුවගෙ අම්මයි තාත්තයි හිනා වෙවී බලාගෙන ඉඳිද්දි. "එපා පුතේ" කියලා නිකම් වත් කිව්වෙ නැහැ. අනේ අර ගෙදර අය බලං හිටියෙ කරන්න දෙයක් නැතිව. අමුත්තන්ගෙ හිත රිද්දන්නත් බැහැනෙ. ඊළඟට අර දරුවා හැරුණෙ සාලයේ කොණක පෝච්චියක තිබ්බ වටිනා මල් ගහ දිහාට. ඒකෙ කොළ එකින් එක කඩන්න පටන් ගත්තා. අර අම්මයි තාත්තයි හිනා වෙවී බලන් හිටියා. ඒ පාර නම් ගෙදර ස්වාමිදුව වෙච්ච අපේ යාලුවා ඉස්සරහට ගිහින් "අනේ පුතේ ඕක නම් කඩන්න එපා" කියලා මල් පෝච්චිය ගෙදර උඩ තට්ටුවටම ගෙනිහින් තිබ්බා. අර අම්මයි තාත්තයි නෙවෙයි දරුවගෙ වරදට සමාවක් වත් ඉල්ලුවෙ. එයාල දෙන්නට මේක හොඳට පුරුදු වැඩක් වගේ.

කොහොමත් බොහොමයක් සිංහල දරුවන්ගේ නොහැදුණ කම ගැන හැම තැනම කතා වෙනවා චූටි මල්ලිට ඇහිලා තියෙනවා. ඒකනෙ අර තායි පන්සලකටත් ලංකාවෙ අය වැද්ද ගන්න එපා කියලා ඊමේල් වයාපාරයක් ගියේ.

දරුවන්ට ගහන්න බනින්න ඕනෙ නැහැ. ඒත් දෙමාපියන් දැනගන්න ඕනෙ තමන්ගෙ දරුවන් හැදියාවකින් යුත් දරුවන් බවට පත් කරන්න. දරුවන්ට බයේ ජීවත්වෙලා ඒ වැඩේ කරන්න බැහැ. දෙමාපියන් දරුවන්ට ඉහළින් ඉන්න ඕනෙ. ඔන්න චූටිමල්ලිට හිතිච්ච දේ කෙළින්ම ලියලා දැම්මා. කවුරුත් චූටි මල්ලි එක්ක අමනාප වෙන්න එපා ඇත්ත පෙන්නලා දුන්නට.

## අමාරුම මාසයක්

මේ කාලය මාර නරක කාලයක් කියලා චූටි මල්ලිට හිතෙනවා. හැම දවසකට අහන්න ලැබෙන්නෙ කවුරු හරි වැදගත් කෙනෙක්ගෙ මරණයක්. ජූනි මාසෙත් අඩු නැතිව ඒ කතා අහන්න ලැබුණා. නාට්‍යයට මහා සේවයක් කළ එස් කරුණාරත්න මහත්තයා, සිංහල ගීතයේ වෙනස්ම ලකුණක් තිබ්බ අයිවෝ ඩෙනිස් මහත්තයා, ගායනයෙන් නමක් තැබූ අතුල සෝමසිරි, සිංහල සිනමාව වෙනුවෙන් මහා මෙහෙවරක් කළ රංග ශිල්පියා රෝයි ද සිල්වා. තරුණ පුවත්පත් කතුවරයා චාමර ලක්ෂාන් ඒ අතරින් නම් කීපයක් විතරයි. මේ අය ගැන කොයි තරම් දේවල් ලියන්න පුලුවන් ද?

චූටි මල්ලිගෙ ඒ හැටි කාලයක් නැති ජීවිතය දිහා ආපහු හැරිල බලද්දි මේ වගේ කොයි තරම් දෙනෙක් යන්නම යන්න ගිහින්ද? මේ අය නිසා හිත්වල ඇති වන වේදනාවත් ඒ අය මේ ලෝකයට කළ සේවයත් කවදාවත් නම් හිතෙන් මැකී යන්නෙ නැහැ. ඒ තරමට ඒ මිනිස්සු වටිනවා.

මේ හැම දෙයක් අස්සෙම චූටි මල්ලිට කල්ප නාවෙන දෙයක් තියෙනවා. ගරු කළ යුතු මිනිස්සුන්ට ඒ ගෞරවය ලබා දෙන්න ඒ මිනිස්සු මැරනෙකම්ම බලා ඉන්න එපා කියන එක. මැරුණම කියන දේවල් නිකං හිස් වචන විතරයි. ගරු කළ යුත්තන්ට ඒ අයගෙ ජීවිත කාලෙදිම ඒ ගෞරවය ලබා දෙන්න. ඒ වෙනුවෙන් සොයා බලා වැඩ කරන්න. චූටි මල්ලි සමාජයෙන් ඉල්ලන්නෙ එච්චරයි.

චූටි මල්ලි

